# ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාව
# SRI LANKA COUNCIL OF ARCHAEOLOGISTS

**(1992 අංක 04 දරණ පාර්ලිමේන්තු පනතින් සංස්ථාගත කර ඇත, Incorporated Under Act No. 04 of 1992)**

**පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ 07**
**Department of Archaeology, Colombo 07**

SLCA


**දිනය /Date: 2025/02/03**

ගරුතර ස්වාමීන්වහන්ස/මහත්මයාණෙනි/මහත්මියනි/මෙනෙවියනි,

**ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාවේ මහා සභා රැස්වීම පැවැත්වීම, ප්‍රගති සමාලෝචනය හා 2025/2026 වර්ෂය සඳහා නව පාලක සභාව පත්කර ගැනීම**

ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාවේ 2025.01.03 දින පැවති පාලක සභා රැස්වීමේ දී යෝජනා ස්ථිර කරගත් පරිදි, 2025/2026 වර්ෂය සඳහා මහා සභා රැස්වීම එළඹෙන මාර්තු මස පැවැත් වේ.

02. ඒ අනුව ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාවේ මහා සභා රැස්වීම **2025** මාර්තු මස 28 වන සිකුරාදා පෙ.ව. 09.30ට කොළඹ 07, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත පිහිටි ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තු ශ්‍රවණාගාරයේ දී පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත.

03. මෙම මහාසභා රැස්වීමේ **දී** ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාව විසින් පසුගිය කාලසීමාව තුළ සිදුකරන ලද ක්‍රියාකාරකම් පිළිබඳව සමාලෝචනයක් ඉදිරිපත් කිරීමට ද නියමිත ය.

04. ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාවේ 1992 අංක 04 දරණ (සංස්ථාගත) පනත ප්‍රකාරව දැනට පවත්නා කාරක සභික තනතුරුවල නිල කාලය 2025.03.28 යන දිනෙන් අවසන් වන බැවින්, 2025/2026 වර්ෂය සඳහා අලුතින් කාරක සභික තනතුරු පත්කර ගැනීම ද එදිනට සැලසුම්කර ඇත. එම කාරක සභික තනතුරු සඳහා ඔබට ද ඉල්ලුම් කළ හැකි ය.

05. ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාවේ උක්ත පනත ප්‍රකාරව සම ලේකම් තනතුරක් දැරිය හැක්කේ අඛණ්ඩව වසර දෙකක් පමණක් වන බැවින් එකී කාලය ඉකුත්වීම නිසා සම ලේකම් තනතුරු දෙකින් එක තනතුරක් ද පුරප්පාඩු වේ. එසේම භාණ්ඩාගාරික සහ උප භාණ්ඩාගාරික යන තනතුරු ද පුරප්පාඩු වන බැවින් එම තනතුරු ද මෙම වසරේ පත්කර ගත යුතු වේ.

| | | |
|---|---|---|
| සමලේකම් තනතුර | 01 | යටත් පිරිසෙයින් එක් ධූර කාලයක්වත් පාලක සභාවේ සේවය කර ඇති සංස්ථාගත සාමාජිකයෙකු වීම. |
| භාණ්ඩාගාරික තනතුර | 01 | යටත් පිරිසෙයින් එක් ධූර කාලයක්වත් පාලක සභාවේ සේවය කර ඇති සංස්ථාගත සාමාජිකයෙකු වීම. |
| උප භාණ්ඩාගාරික තනතුර | 01 | යටත් පිරිසෙයින් එක් ධූර කාලයක්වත් පාලක සභාවේ සේවය කර ඇති සංස්ථාගත සාමාජිකයෙකු වීම. |

06. කාරක සභික තනතුරු 11 කි. එහි සංයුතිය පහත සඳහන් පරිදි වේ.

| | | |
|---|---|---|
| (අ) සංස්ථාගත සාමාජිකයින් | 08 යි. | මෙම සාමාජික කාණ්ඩය අධි සාමාජික, සාමාජික හා සහාය සාමාජිකයන්ගෙන් සමන්විත වන අතර එය යටත් පිරිසෙයින් සහාය සාමාජිකයන් තිදෙනෙකුගෙන් (03) වත් සමන්විත විය යුතුය. |
| (ආ) ලියාපදිංචි සාමාජිකයින්<br>(ඇ) ශිෂ්‍ය සාමාජිකයින් | 03 යි. | අවම වශයෙන් එක් (01) ලියාපදිංචි සාමාජිකයෙකු හා එක් (01) ශිෂ්‍ය සාමාජිකයෙකු ඇතුළත් වන පරිදි 03 දෙනෙකුගෙන් සමන්විත විය යුතුය. |

යථෝක්ථ (අ,ආ,ඇ) එක් එක් තනතුරක් සඳහා වෙන වෙන ම අයදුම්පත් මඟින් ඉල්ලුම් කළ යුතු ය. එම අයදුම්පත් 2025 මාර්තු මස 14 වන දින ප.ව. 04.00ට පෙර ලැබෙන සේ **සම ලේකම්, ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාව කාර්යාලය, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ 07** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනැවිත් භාරදිය යුතු ය**.** ඊට අදාළ අයදුම්පත ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාවේ **slca.lk** වෙබ් අඩවියෙන් (යාවත්කාලීන කළ වහාම) සහ නිල මුහුණු පොතෙන් **(Sri Lanka Council of Archaeologists)** බාගත හැකි ය. තනතුරු සඳහා ඉල්ලුම් කිරීමේ දී ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරෙහි **ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාවේ පාලක මණ්ඩලයේ ඔබ විසින් ඉල්ලුම් කරනු ලබන තනතුරු නාමය** සඳහන් කළ යුතු ය. මෙම සෑම තනතුරක් සඳහා ම අයදුම්කරුවන්ගේ කැමැත්ත ප්‍රකාශ වී තිබිය යුතු අතර, ඉහත අංක 01 සිට 06 දක්වා තනතුරු සඳහා සංස්ථාගත සාමාජිකයන් දෙදෙනෙක් ද, ඉහත අංක 06 (ආ) තනතුර සඳහා ලියාපදිංචි සාමාජිකයින් දෙදෙනෙකුගෙන් ද ඉහත අංක 06 (ඇ) තනතුර සඳහා ශිෂ්‍ය සාමාජිකයින් දෙදෙනෙකුගෙ**න්** ද, යෝජනා ස්ථිර කරමින් නාම යෝජනා ඉදිරිපත් කළ යුතු ය. **2025.03.14 දින ප.ව. 04.00න් පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

මෙම තනතුරු සඳහා **ඉල්ලුම් කරන සාමාජික භවතුන් සහ යෝජනා ස්ථිර කරනු ලබන්නන්** නියමිත පරිදි **2025.03.14** දින වන විට **2024** වර්ෂය සඳහා සහ ඊට පෙර වර්ෂවල වාර්ෂික සාමාජික මුදල් ගෙවා අවසන් කොට තිබිය යුතු ය. ඔබ විසින් ගෙවිය යුතු සාමාජික මුදල් පිළිබඳ වාර්තාවක් එක් එක් සාමාජිකත්වයට අදාළව ඇමුණුමක් වශයෙන් ශ්‍රී ලංකා පුරාද්‍යාඥයන්ගේ සභාවේ නිල වෙබ් අඩවියේ සහ නිල මුහුණු පොතෙහි යථා කාලයේ දී උඩුගත කෙරෙනු ඇත.

ඉහත මුදල් **2025.03.14** දින හෝ එදිනට පෙර ලංකා බැංකුවේ නිදහස් චතුරස්‍ර ශාඛාවේ 0006089718 අංක දරණ ගිණුම් අංකයට බැර කොට**,** ලදුපතෙහි පිටපතක් **සමලේකම් ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාව කාර්යාලය, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ 07** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. නැතහොත් එදිනට පෙර පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ පිහිටි ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාවේ කාර්යාලයට ගෙවා ලදුපතක් ලබාගත යුතු ය. බැංකුගත කළ මුදල්වලට අදාළ ලදුපතෙහි ඔබගේ නම, ඔබ දැනට දරණ සාමාජිකත්වය හා සාමාජික අංකය ද සඳහන් කරමින් ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයින්ගේ සභාවේ සම ලේකම් වෙත ඉහත ලිපිනයට එවිය යුතු වේ. **අදාළ ලේඛනවල ඔබ විසින් මුදල් ගෙවූ බවට සටහන් තබනු ලබන්නේ ඔබ විසින් බැංකුවට මුදල් ගෙවන ලද ලදුපතෙහි පිටපත අප වෙත ලැබීමෙන් පසුව පමණි.** එසේ නොවන්නේ නම් ඔබ බැංකුවට මුදල් ගෙවා ඇතත් මුදල් නොගෙවූ අයෙකු සේ සැලකේ.

**(සැලකිය යුතුයි : ඔබ ලංකා බැංකුවට මුදල් බැරකරන විට බැංකු ලදුපතෙහි ඔබගේ නම සහ SLCA සාමාජික අංකය සඳහන් කිරීමට කාරුණික වන්න)**

සාමාජික මුදල් නොගෙවීමෙන් ඔබගේ සාමාජිකත්වය අහෝසි වන අතර, එසේ සාමාජිකත්වය අහෝසි වුවහොත් නැවත නව සාමාජිකයෙකු ලෙස සාමාජිකත්වය සඳහා අයදුම් කළ යුතුය. එසේ වුවහොත් සංස්ථාගත සාමාජිකත්වය ඇති අයට **"පුරාවිද්‍යාඥ"** යන අභිධානය භාවිත කිරීමත්, පුරාවිද්‍යා ආඥා පනතින් හා ගැසට් නිවේදන මගින් ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාවේ සංස්ථාගත සාමාජිකයන්ට පවරා ඇති කාර්යයන් සඳහා අයදුම් කිරීමත්, භාර ගැනීමත්, එම කටයුතු සංස්ථාගත නොවන සාමාජිකයන්ට පැවරීමත්, ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයන්ගේ සභාවේ පනත උල්ලංඝනය කිරීමක් වේ.


07. මහ සභාවට ඉදිරිපත් කළ යුතු නව යෝජනා හා අදහස් ඇතොත්, 2025.03.20 වන දිනට පෙර ඉහත ලිපිනයට ලිඛිත ව දන්වා එවන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමු.

08. මෙදින සහභාගී වන සියළු ම සාමාජිකයන් ස්වකීය වෘත්තීයභාවයට ගැලපෙන පරිදි සුදුසු ඇඳුමකින් සැරසී පැමිණිය යුතු ය.

09. මහාසභා රැස්වීමට ඔබගේ සහභාගීවීම පිළිබඳව 2025.03.20 දිනට පෙර පහත සඳහන් දුරකථන අංකයන්ට කෙටි පණිවිඩයක් එවීමට කාරුණික වන්න.

සමලේකම් - පුරාවිද්‍යාඥ අයි.ඩී.එම්.විජේබණ්ඩාර මහතා 071 525 6594
සමලේකම් - පුරාවිද්‍යාඥ එම්.ඩී. කලණ මාරසිංහ මහතා 074 285 7965

10. මෙදින මහ සභාවට සහභාගී වන සියලු සාමාජික භවතුන් වෙත දිවා ආහාරය සපයනු ලැබේ.



ගරු සමලේකම්
පුරාවිද්‍යාඥ අයි.ඩී.එම්.විජේබණ්ඩාර



ගරු සමලේකම්
පුරාවිද්‍යාඥ එම්.ඩී. කලණ මාරසිංහ

සභාපති / President: 071 417 9869 සම ලේකම්වරු/Joint Secretaries: 071 525 6594/074 285 7965
E-mail: archaeologistsslca@gmail.com
Tele: (011) 2695255 (Office)